# 15 ළඳේ නිසරු නො කරන් අප සියලා

'වෙසතුරු දා කව' හෙවත් 'වෙස්සන්තර ජාතක කාව්‍යය' පන්සියපනස් ජාතක පොතෙහි මෙන් ම බුත්සරණෙහි එන වෙස්සන්තර ජාතකය කවියට නඟමින් ලියවුණකි. මෙය මහනුවර රාජධානි සමයේ රචනා වූ මෙස් පිළිගැනේ. විදග්ධ හෙවත් සම්භාව්‍ය සාහිත්‍ය ධාරාවෙන් බැහැර කෘතියක් සේ සැලකෙන වෙස්සන්තර ජාතක කාව්‍යය, චූල සම්ප්‍රදායේ සාහිත්‍ය ගණයෙහි ලා සැලකේ. මෙහි කතුවරයාගේ නාමය කිසි තැනක නොදැක්වෙයි. එහෙත් ඔහු සිංහල භාෂා ව්‍යවහාරයෙහි පරිචයක් මෙන් ම විශිෂ්ට ප්‍රතිභානයක් ද සහිත නිර්මාණකරුවකු සේ සැලකිය හැකි ය. 'ජූජක' නම් මහලු බමුණකු සිඟා ගොස් ලද කහවණු සියය හිතවත්, දුප්පත් බමුණු ගෙදරක පරෙස්සමට තබන්නේ නැවත ගන්නා අටියෙනි. බමුණාට එම මුදල් වියදම් වෙයි. ඒ නිසා හිලව්වට තම දුව ජූජකට දීමට ඔහුට සිදු වෙයි. ජූජක බමුණා ද ළා බාල තරුණිය විවාහ කර ගනී. අමිත්තතාපා නම් වූ ඈ වියපත් බමුණාට කළ යුතු මෙහෙවර කරමින් යහපත් දිවියක් ගෙවයි. මෙය සැළ වූ ඒ බමුණු ගම තරුණ බමුණෝ, තරුණ බැමිණියක ජරපත් දුර්වල වූ වියපත් බමුණකුට මෙලෙස මෙහෙවර කරද්දී තම තමන්ගේ බැමිණියන් තමන්ට මෙහෙවර නො කරති'යි ඔවුන්ට ගැහැට කරති. එයින් මිදීමට සිතන ඒ ගමෙහි බැමිණියෝ පැන් තොටේ දී ජූජක බමුණාගේ නුගුණ කියමින් දෙදෙනා වෙන් කිරීමට දරන උත්සාහයත් ඒ ඇසූ බැමිණිය ජූජක බමුණා කෙරෙහි දක්වන ප්‍රතිචාරත් පාඩමේ ඇතුළත් කවි මගින් පළ කෙරේ.

ලීල් නැති ව නිසරු ව තෙපලන්නේ
මහල්ල නුඹගේ හිමි ද අසන්නේ
වාල් තමාවත් ඇද්ද ඉතින්නේ
වාල් විඳින දුක මෙනුඹ විඳින්නේ

පැසී ඉසත් නිකටත් සොඬු ඇකිලේ
ගැසී කුදත් යන ගමනත් බකලේ
නිසී වේ ද වෙත ඉඳිනට මෙකලේ
ගැසී ද බොල තිගෙ දැසට පටලේ

කුදේ ගැසී නැගිටින කල වෙවුලා
තදේ කැසිත් කැස කැස පට අකලා
සොඳේ විඳින සැප විඳුමට මෙකලා
ළඳේ නිසරු නොකරන් අප සියලා



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

බඩ වක පිට වක සන්       වැරටිල්ලා
දෙපටට කුදු ගැසි වකට       කුදුල්ලා
ඉසකේ පුපුරටි දත් කඩ       තොල්ලා
තිගෙ සැමි බමුණා කුණු කෙළ       තොල්ලා

පෙර කල් ජාතියෙ පැතුවා       වැන්නේ
පර මල් පිදුවාදෝ පල       දුන්නේ
නර මුල් ඇඟ ඇට කිඹුලකු       වැන්නේ
හැම කල් මළ දා දෝ සැප       වන්නේ

ගැසී වකට කුදු ඉසකේ සුදු       රළු
පැසී නිකට දත් බොල්ලෑ කෙළ       තොලු
වැසී තිබෙන ඇස් බිය කරලන       සුලු
නැසී කුමට ඉඳ උගෙ ගෙයි එක්       කොලු

එක මග යන කල ඔබිනට       ඇද්දෝ
ආනන කල උගෙ කට ගඳ       නැද්දෝ
තී සැටි බමුණන් මේ රට       නැද්දෝ
ගැට කෝනමකුට ඉඳ පල       ඇද්දෝ

එබසට ලජ්ජාවෙන් ලද       බැමිණී
අබ සැට ලාසක් පුපුරන       ලෙසිනී
විළි වැද ඉවසා රොස් කොට       එඩිනී
කළ ගෙඩි බිඳ ගොස් තම ගෙට       වැදුණී

වෙවුලයි පුපුරයි දත් කයි රොස්       කොට
සූරයි කම්මුල් දෙක ඇද තර       කොට
තැවුලයි ගිය ගිය තැන රට වට       මට
අවුලයි වෙන්නේ මෙතනින්       යන්නට

මූණ රවා ගෙන ගොස් ගෙට       වැදිලා
පූන නූල ඇද දමමින්       බිඳලා
යානේ උන් බමුණා බිම       පෙරළා
බාන ලෙසට අල්ලා ගෙන       රවුළා

කන්සෙට පාරක් දෙමැයි       කියන්නී
මන් බොල තට දර දිය ද       අදින්නී
කන්නට පැන්නා මෙන්       වැලහින්නී
කන් කටුවට කරදර       තෙපලන්නී

## අරුත් පැහැදිලි කිරීම

| | | |
|---|---|---|
| ලීල් නැතිව | - | මොළොක් බවෙන් තොර ව, බුරුලක් නොදක්වා |
| වාල් | - | වහලා, දාසයා |
| සොඬු | - | කම්මුල |
| කැසපට | - | ඇඳිවතෙහි පහළ කොන |
| බඩ වක | - | බඩෙහි වකය |
| පිට වක | - | පිටෙහි වකය |
| වැරටිල්ලා | - | වියළි ගොම කැබලි |
| පුපුරැටි | - | පුපුරු වැනි වූ |
| දත් කඩතොල්ලා | - | දත් කඩතොලු |
| කුණුකෙළතොල්ලා | - | කට දෙකොනින් කුණුකෙළ වැහෙන |
| නරමුල් | - | පැසුණු කෙස් |
| ආනන කල | - | ඇනුම් අරින විට |
| කෝනමකුට | - | කොන්ද නැමුණු මිනිහකුට, කුදකුට |
| රොස් කොට | - | කෝප වී |
| පූන නූල | - | බ්‍රාහ්මණයන් උපනයනයේ දී පලඳින නූලක්. මෙය වම් උරහිසෙහි සිට සිරුරේ හරස් අතට දකුණු ඉඟටිය දක්වා වැටෙන සේ දමන්නකි. |
| කන්සෙට පාරක් | - | කම්මුලට පහරක්, කනට පහරක් |
| කන්කටුවට | - | කර්ණ කඨෝර ලෙස, අමිහිරි ලෙස |

## අවබෝධය

1. 'ලීල් නැතිව' යන කවියේ 'නුඹ' යනුවෙන් හඳුන්වා ඇත්තේ කවරෙක් ද?
2. පහත දැක්වෙන කවි පදවල අදහස ඔබේ වචනයෙන් ලියන්න.
   i. අවුලයි වෙන්නේ මෙතනින් යන්නට
   ii. ගැසී ද බොල තිගෙ දැසට පටලේ
   iii. ළඳේ නිසරු නොකරන් අප සියලා
   iv. හැම කල් මළ දා දෝ සැප වන්නේ
   v. කන්කටුවට කරදර තෙපලන්නේ

3. 'පරමල් පිදුවා දෝ පල දුන්නේ' මේ ප්‍රකාශයට හේතුව කුමක් ද?
4. බැමිණියන්ගේ බසින් ලජ්ජාවට පත් අමිත්තතාපා පිළිබඳ විස්තර කිරීමේ දී කවියා භාවිත කර ඇති උපමාව කුමක් ද?
5. බැමිණියන්ගේ බසින් ලජ්ජාවට පත් අමිත්තතාපාගේ හැසිරීම කෙබඳු වී ද?

## ලිඛිත අභ්‍යාස

1. පහත දැක්වෙන වචන සඳහා සමානාර්ථ පදය බැගින් පාඩමෙන් උපුටා ලියන්න.

| | | | |
|---|---|---|---|
| i. | දෙනෙතට | vi. | මේ කාලයෙහි |
| ii. | භවයේ | vii. | විළියෙන් |
| iii. | ප්‍රාර්ථනා කළා | viii. | කොපුල් |
| vi. | ප්‍රයෝජන | ix. | සයනයෙහි |
| v. | ගර්වයෙන් | x. | තදින් |

2. පහත දී ඇති උපමාවන්හි ඇතුළත් උපමානය හා උපමේය වෙන් කර දක්වන්න.

i. නරමුල් ඇඟ ඇට කිඹුලකු වැන්නේ
ii. කන්නට පැන්නා මෙන් වැලහින්නී

3. එළිසමය රැකීමට පහත දැක්වෙන යෙදුම් කවි පෙළෙහි දක්වා ඇති ආකාරය සඳහන් කරන්න.

| | |
|---|---|
| i. ඉතින් | v. කුදු |
| ii. බකල් | vi. ලෙසින් |
| iii. සියලු | vii. රවුළ |
| iv. වැරටි | viii. වැනිය |

## ප්‍රායෝගික අභ්‍යාස

1. කවි පෙළේ ඇතුළත් අවස්ථාවක් භූමිකා රංගනයක් ලෙස ඉදිරිපත් කරන්න.